# කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ උපාධි අපේක්ෂකයින් සඳහා වන ආචාර ධර්ම පද්ධතිය

## (Honour Code)

### අ. ආචාර ධර්ම පද්ධතියේ අරමුණ:

විශ්ව විද්‍යාල අධ්‍යයන සහ පර්යේෂණ උපාධි පාඨමාලා වල ප්‍රමිතියේ පදනම වන්නේ අවංකභාවය සහ විශ්වාසනීයත්වය (අඛණ්ඩතාවය / academic integrity) යි. මේ අනුව, කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ ශිෂ්‍ය කාලය තුළදී සහ ඉන් පසුව ද, උපාධි ශිෂ්‍යයන් විසින් මෙහි දැක්වෙන ආචාර ධර්ම පද්ධතියට අනුගත වනු ඇතැයි අපේක්ෂා කෙරේ. අධ්‍යයන කටයුතු වලදී පැවතිය යුතු විශ්වාසනීයත්වය (අඛණ්ඩතාවය/academic integrity) ද, විභාග නීති සහ රෙගුලාසි ද, ශිෂ්‍යයෙකුගේ තිබිය යුතු මනා හැසිරීම ද, එමෙන්ම, උගත් ශිෂ්‍යයෙකු, ගෞරවනීය ශ්‍රී ලාංකීය පුරවැසියෙකු පමණක් නොව කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය නියෝජනය කරන තානාපතිවරයෙකු ලෙස පවතින වගකීම් හා යුතුකම් ද මෙම ආචාර ධර්ම පද්ධතියට අන්තර්ගත වේ. මෙම ආචාර ධර්ම පද්ධතිය විසින් විද්‍යාර්ථීන් අතර පැවතිය යුතු සාධාරණත්වයත්, ජාත්‍යන්තර අධ්‍යයන හා පර්යේෂණ ප්‍රමිතීන් පවත්වා ගැනීමත්, සදාචාරාත්මක හැසිරීමත් මෙන්ම ශ්‍රී ලංකාවේ නීති පද්ධතියට අනුකූල වීමත් ප්‍රවර්ධනය කෙරේ. බුද්ධිමය හැකියාවන් වැඩි දියුණු කර ගැනීම මෙන්ම උතුම් ගුණාංග වලට සහ ආචාර ධර්ම පද්ධතිය සමග සැබැඳි ජීව ගුණයට අනුගත වීම තුළින් ලොව පුරා පිළිගන්නා වෘත්තිකයන් බවට පත්වීමට ඇයගේ විද්‍යාර්ථීන් තුළ පවත්නා අපරිමිත හැකියාව සම්බන්ධව කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය විසින් ඉස්මතු කොට පෙන්වා දෙනු ලැබේ.

### ආ. අධ්‍යයනයේ පැවතිය යුතු විශ්වාසනීයත්වය (අඛණ්ඩතාවය/ Academic Integrity)

සිසුන්, තනි තනිව මෙන්ම සාමූහිකව,

1. විභාග, පැවරුම්, අධ්‍යයන හා පර්යේෂණ ව්‍යාපෘතිවලට අදාළ නීතිරීතිවලට අනුකූල වීම සිදු කළ යුතුය.

2. පහත සඳහන් වන අධ්‍යයන කටයුතු අතරතුර දී ගුරුවරයා / කථිකාචාර්යවරයා විශේෂ වශයෙන් සඳහන් කොට පැහැදිලිවම අවසර ලබා දෙන්නේ නම් මිස, වෙනත් අයගෙන් උපකාර ලබා ගැනීම නීති විරෝධී වන අතර ඒවා නොකළ යුතුය.

(i) පන්ති අතරතුර පවරා ඇති පැවරුම් ("පන්තියේ පැවරුම්"/in-class Assignments)

(ii) නිල වේලාවෙන් පිටත සම්පූර්ණ කළ යුතු පැවරුම් ("ගෙදරදී කිරීමට දෙන පැවරුම්"/"Take-Home Assignments")

(iii) විවෘතව පොත් පරිශීලනයෙන් කිරීමට දෙනු ලබන පැවරුම් ("Open-Book Assignments")

(iv) වාචික පරීක්ෂණයක් (*viva*) අන්තර්ගත වන හෝ නොවන ද, බහුමාධ්‍ය ඉදිරිපත්කිරීමක් (presentation) අන්තර්ගත හෝ නොවන පරිදි ද සැලසුම් කරන ලද, ඒක පුද්ගල වශයෙන් සහ කණ්ඩායම් වශයෙන් කිරීමට දෙන ව්‍යාපෘති/පැවරුම් (Invidividual or Group Projects)

(v) කථිකාචාර්යවරයා/ගුරුවරයා විසින් සඳහන් කරන ක්‍රියාකාරකමක්

3. ගුරුවරයා / කථිකාචාර්යවරයා විසින් පැහැදිලිවම සඳහන් කිරීමකින් අවසර ලබා දෙන්නේ නම් මිස, අධ්‍යයන අවංකභාවය (අඛණ්ඩතාව / Academic Integrity) පවත්වා ගැනීම සඳහා භෞතිකව, වාචිකව, ඩිජිටල් හෝ වෙනත් අයුරකින් ප්‍රශ්න වලට අදාල පිළිතුරු, පැවරුම්/ව්‍යාපෘති වාර්තා, හෝ ප්‍රශ්න වලට අදාල ඉඟි/ඇඟවීම් අදිය හෝ වෙනත් අනියම් උපකාරකයක් පහත අයුරින් ලබා ගැනීමත්, බෙදා හැරීමත්, ස්ථානගත කිරීමත්, පළ කිරීමත් නීති විරෝධී වන අතර ඒවායින් වැලකිය යුතුය.

(i) භෞතික (ලිඛිත/මුද්‍රිත/වෙනත් අයුරකින් දැක්වෙන) නීති විරෝධී උපකාරකයක් ලබා ගැනීම, බෙදා හැරීම, ස්ථානගත කිරීම, හෝ පළ කිරීම

(ii) අන්තර්ජාල / පරිගණක ජාල මගින් නීති විරෝධී උපකාරකයක් ලබා ගැනීමත්, බෙදා හැරීමත්, ස්ථානගත කිරීම, හෝ පළ කිරීම

(iii) සමාජ මාධ්‍යවල ආධාරයෙන් නීති විරෝධී උපකාරකයක් ලබා ගැනීම, බෙදා හැරීම, ස්ථානගත කිරීම, පළ කිරීම

(iv) වෙනත් සන්නිවේදන මාධ්‍යයන්ගේ උපකාරයෙන් නීති විරෝධී උපකාරකයක් ලබා ගැනීම, බෙදා හැරීම, ස්ථානගත කිරීම, පළ කිරීම

(v) ඡායාරූප වශයෙන් නීති විරෝධී උපකාරකයක් ලබා ගැනීම, බෙදා හැරීම, ස්ථානගත කිරීම, පළ කිරීම

(vi) අභිනයන් හෝ සංඥා භාෂාව හෝ වෙනත් අයුරකින් නීති විරෝධී උපකාරකයක් ඇඟවීම.

4. මුදල් හෝ වෙනත් අරමුණු සඳහා සිදු කරන "වෘත්තීමය නිබන්ධනය / වාර්තාව / පැවරුම් ලේඛකයින්" ("professional thesis/report/assignment writers") වැනි වංචනික සේවාවන් ලබා ගැනීමෙන්, උපදෙස් ලබා ගැනීමෙන් වළකින්න.

5. අදාල පාර්ශ්ව වලින් නිසි අවසරයකින් තොරව, තමන්ගේම හෝ වෙනත් අයට අයත් ඩිජිටල් අන්තර්ගතයට හෝ භෞතික දේපල වලට ප්‍රවේශ වීම, විද්‍යුත් ජාල ආශ්‍රිතව සිදු වන විෂමාචාරයන්ට අනුබල දීම, ප්‍රවර්ධනය කිරීම හෝ පහසුකම් සැපයීම වැනි ඩිජිටල් විෂමාචාර සහ සයිබර් අපරාධවලින් වළකින්න.

6. තමන්ගේම ප්‍රතිඵල වංක ලෙස වැඩිදියුණු කරන සහ/හෝ අනෙක් විද්‍යාර්ථීන්ගේ ප්‍රතිඵල වැඩි දියුණු කරන හෝ අඩු කරන කිසිදු ක්‍රියාවකට සහභාගී නොවන්න.

**<u>ඈ. ආචාර ධර්ම පද්ධතිය උල්ලංඝණය කිරීම.</u>**

ආචාර ධර්ම පද්ධතිය උල්ලංඝණය වන උදාහරණ කිහිපයක් පහත දැක්වෙන අතර ඒවාට පමණක් සීමා නොවේ.

1. පිළිතුරක් හෝ පිළිතුරු පත්‍රය හෝ පැවරුමක් හෝ පැවරුම් වාර්තාවක් හෝ බහුමාධ්‍ය ඉදිරිපත් කිරීමක් (presentation) හෝ ලකුණු ලබා දෙන ඕනෑම අධ්‍යයන අංගයක් සම්පූර්ණ වශයෙන් හෝ කොටසක් වශයෙන් පිටපත් කිරීම.
2. විද්‍යාර්ථියාට හෝ වෙනත් කෙනෙකුට අයත් පිළිතුරු පත්‍රයක් වෙනත් අයෙකුට භාරදීම හෝ එදෙස වංචනික අයුරින් බැලීමට අවසර දීම හෝ නිරාවරණය කිරීම.
3. පැහැදිලි ප්‍රකාශයකින් විධිමත් ලෙස යම් විද්‍යුත් උපකරණයකට අවසර ලබා දී නොමැති පසුබිමක විභාග, පැවරුම් හෝ ශ්‍රේණිගත කිරීම හා සම්බන්ධ ඕනෑම ක්‍රියාකාරකමක් අතරතුර අනවසර විද්‍යුත් උපකරණ භාවිතා කිරීම.
4. වෙනත් අයෙකු විසින් ලියන ලද රචනාවක් හෝ පිළිතුරක් හෝ වෙනත් ලේඛණයක් නියමාකාරව මූලයන් දක්වා උපුටා ගැනීමෙන් තොරව සිදු කරන ලද ලේඛන-කොල්ලකෑමක්/චෞරත්වයක් (plagiarism) සිදු වූ බව නිසි බලධාරීන් / ගුරුවරයා / කථිකාචාර්යවරයා විසින් පරීක්ෂා කිරීමකින් හෝ මෘදුකාංගයක් ආශ්‍රිතව හෝ වෙනත් අයුරකින් හෝ සොයා ගැනීම.

5. වෙනත් විද්‍යාර්ථීන් හෝ බාහිර පුද්ගලයින්ගෙන් සහ බාහිර ආයතනවලින් රහසිගතව තබා ගැනීමට අපේක්ෂා කරන ප්‍රශ්න බැංකුවලින් (question banks) ප්‍රශ්න නිරාවරණය කිරීම.
6. වෙනත් ශිෂ්‍යයෙකුගේ පිළිතුරක් / පිළිතුරු පත්‍රයක් / පැවරුමක් / පැවරුම් වාර්තාවක් / බහුමාධ්‍ය ඉදිරිපත් කිරීමක් (presentation) ආදිය අර්ධ වශයෙන් හෝ සම්පූර්ණයෙන් වෙනස් කිරීමකින් තමන්ගේ අලුත් පිළිතුරක් / පිළිතුරු පත්‍රයක් / පැවරුමක් / පැවරුම් වාර්තාවක් / බහුමාධ්‍ය ඉදිරිපත් කිරීමක් (presentation) ලෙස ඉදිරිපත් කළ කල්හි ගුරුවරයෙකු / කථිකාචාර්යවරයෙකු / නිසි බලධාරීන් හෝ කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ අධ්‍යක්ෂ විසින් පත් කරන ලද ඕනෑම බාහිර ඇගයුම්කරුවෙකු විසින් තහවුරු කරන ලද පරිදි එහි සාවද්‍යතාවය තහවුරු වීම.
7. වෙනත් ශිෂ්‍යයෙකුගේ පිළිතුර ස්වකීය නව පිළිතුරක් ලෙස වංචනිකව ඉදිරිපත් කිරීම.
8. මුදල් ගෙවා නිබන්ධන / පැවරුම් / වාර්තා ලිවීමේ සේවාවක් ලබා ගැනීම.
9. අධ්‍යයන කටයුතු වලට වංචා සිදුකිරීමේ අටියෙන් කරන සියලු ආකාරයේ කුමන්ත්‍රණකාරී හැසිරීම්; එනම්, උදාහරණ ලෙස කණ්ඩායමක් ලෙස හෝ තනි තනිව කිරීමට නියම කරන ලද ගෙදරදී කිරීමට දෙනු ලබන අභ්‍යාස/පැවරුම් ආදියට නීති රීති වලට පටහැනිව අන්‍යයන්ගෙන් උපකාර ලබාගැනීමට සැලසුම් කිරීම වැනි වංචනික කුමන්ත්‍රණ.
10. විද්‍යුත් තැපැල / සමාජ මාධ්‍ය / ඡායාරූපකරණය හෝ වෙනත් ආකාරයේ සන්නිවේදනයන් හරහා පිළිතුරු බෙදා ගැනීම.
11. වෙනත් පුද්ගලයෙකුගේ පිළිතුරු වෙනස් කිරීම හෝ දැනට පොදු භාවිතාවේ පවතින සම්පතක් වංචාකාරී අරමුණින් වෙනස් කිරීමෙන් පසු නව පිළිතුරක් ලෙස ඉදිරිපත් කිරීමට උත්සාහ කිරීම.
12. විද්‍යුත් ලේඛන වල නොමඟ යවන තොරතුරු ඇතුලත් කරමින් සිදු කරන දිවුරුම් ප්‍රකාශයන් සිදු කිරීම, මූල්‍ය වාසි ලබා ගැනීමේ අපේක්ෂාවෙන් ප්‍රතිපූරණය සඳහා ව්‍යාජ රිසිට්පත් / බිල්පත් වැනි දෑ ඉදිරිපත් කිරීම.
13. වෙනත් පුද්ගලයෙකුගේ කාර්යාලයක්, කබඩ්/අල්මාරි, ලේඛන, පරිගණක, මෘදුකාංග පද්ධති සහ ඒ හා සමාන අන්තර්ගතයන් (content) හෝ ආයතන වෙත අනවසරයෙන් ප්‍රවේශ වීම.
14. වෙනත් විද්‍යාර්ථියෙකුට හෝ විශ්ව විද්‍යාල කාර්ය මණ්ඩල සාමාජිකයෙකුට හෝ තෙවන පාර්ශවයකට තර්ජනාත්මකව කථා කිරීම තුළින් හෝ ශාරීරික හානියක්

සිදු කිරීම තුළින් ඍජුව හෝ වක්‍රව වෙනත් පුද්ගලයෙකු අනතුරක හෙළීමට / අනතුරක් කිරීමට උත්සාහ කිරීම/සිදු කිරීම.

15. (පර්යේෂණ පත්‍රිකා වැනි ලේඛණ කටයුතු වලදී) මූලාශ්‍ර උපුටා දැක්වීමට පවතින සම්මත ක්‍රම (referencing styles) අනුගමනය නොකිරීම.
16. පෙර වර්ෂයේ සිසුන්ගේ හෝ වෙනත් විශ්ව විද්‍යාලයක ශිෂ්‍යයෙකුගේ හෝ වෙනත් පන්තියකට ඉදිරිපත් කරන ලද පිළිතුරු පිටපත් (තමාගේ නව පිළිතුරක් ලෙස) ඉදිරිපත් කිරීම.
17. මූලාශ්‍ර සහ කතුවරුන් උපුටා නොදක්වමින් (වෙනත් අයගේ) සංකල්ප, අදහස්, පර්යේෂණාත්මක ප්‍රතිඵල සහ ආදාන දත්ත ආදිය පිටපත් කිරීම.
18. වෙනත් අය විසින් කරන ලද පර්යේෂණ වල පර්යේෂණ ප්‍රතිඵල මත පදනම්ව හෝ වෙනත් අය විසින් ලියන ලද පර්යේෂණ ලිපි ආදිය (තමා විසින් කරන ලද්දක් සේ) වංචනික ක්‍රියාවක් සිදු කිරීමේ අරමුණින් ප්‍රකාශනයට පත් කිරීම හෝ ප්‍රකාශනයට පත් කිරීමට උත්සාහ කිරීම.
19. ව්‍යාපෘති / පාඨමාලා සම්බන්ධීකාරක (Project/Course Coordinator) වෙත සහ ප්‍රධාන උපදේශකවරයා (Main Supervisor) වෙත විධිමත් ලෙස දැනුම් දීමකින් පසුව නිසි අවසරයක් ලබා දුනහොත් මිස, තනි පුද්ගල ව්‍යපෘතියකදී නම් වෙනත් පුද්ගලයෙකු විසින් ද, කණ්ඩායම් ව්‍යාපෘතියකදී නම් එම කණ්ඩායමට පරිභාහිර ව සිටින පුද්ගලයින් විසින් ද සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් අදාල මෘදුකාංග/දෘඩාංග පද්ධතිය ගොඩ නැගීම (implemented) / සැලසුම් කිරීම (designed) / කේතනය (coded) කිරීම.
20. දත්ත හෝ පර්යේෂණ ප්‍රතිඵල වෙනස් කිරීම / ව්‍යාජකරණය කිරීම, දත්ත හෝ පර්යේෂණ ප්‍රතිඵල වලින් කොටසක් නීති විරෝධී / සදාචාර විරෝධී ලෙස බැහැර කිරීම.
21. ශිෂ්‍යයාගේ පර්යේෂණ / ව්‍යාපෘතියේ නව්‍යතාව හෝ වෙනත් අංශ පිළිබඳ විවේචන වලක්වා ගැනීම සඳහා හිතාමතාම පසුබිම් පර්යේෂණ පත්‍රිකා සඟවා තැබීම.
22. වංචාකාරීජර්නල / සම්මන්ත්‍රණවල (predatory journals/conferences) පර්යේෂණ ලිපි ප්‍රකාශයට පත් කිරීම.

## ඇ. ආචාර ධර්ම පද්ධතිය උල්ලංඝනය කිරීමේ දඬුවම්

කොළඹ විශ්ව විද්‍යාලයේ සහ කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේහි අතුරු ව්‍යවස්ථා (By-Laws) මගින් සම්බාධක (sanctions), දඬුවම් (penalties), අධිකරණ බලය (jurisdiction) සහ විධිවිධාන (provisions) අර්ථ දක්වයි; උක්ත කරුණ සම්බන්ධව වලට උදාහරණ කිහිපයක් පහත දැක්වෙන අතර, එනමුදු එම දඬුවම් වලට පමණක් සීමා නොවේ:

1. කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේහි ශිෂ්‍යභාවය අවසන් කිරීම.
2. කොළඹ විශ්ව විද්‍යාලයට හෝ කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ අදාළ උපාධිය (degree), සම්මාන (awards) හෝ අධ්‍යයන/විෂය-බාහිර/විෂයානුබද්ධ ජයග්‍රහණ (academic or extra-curricular or co-curricular achievements) අත්හිටුවීම.
3. විභාග ප්‍රශ්න පත්‍රය හෝ පැවරුම සඳහා ශුන්‍ය ලකුණු ලබා දීම.
4. අදාළ බලධාරීන්ට වාර්තා කිරීම සහ නිල නඩු විභාගයක් පැවැත්වීම හෝ නොපැවැත්වීම.
5. කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේහි පවත්වාගෙන යනු ලබන ශිෂ්‍යයාගේ පෞද්ගලික ලිපි ගොණුවේ සටහන් වන ලිපියක් නිකුත් කිරීම.
6. විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම.
7. එක් එක් සිද්ධිය අනුව දෙනු ලබන දඬුවම් සහ ගනු ලබන අතිරේක ක්‍රියා මාර්ග.

## ඉ. විනය

කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක අධ්‍යයනායතනයේ ගෞරවය පවත්වා ගැනීම සඳහා පහත සඳහන් මාර්ගෝපදේශ පිළිපැදීමට සිසුන්ට උපදෙස් දෙනු ලැබේ:

1. පුරවැසියන් හා උගත් බුද්ධිමතුන් ලෙස විද්‍යාර්ථීන්ගේ නිදහසට ගරු කරන අතරම, කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක අධ්‍යයනායතනයේ සහ එම අවස්ථාවට අදාළ පාර්ශවයන්ගේ තත්ත්වයට ගැලපෙන අයුරින් සුදුසු පරිදි ඇඳුම් පැළඳුම් ඇඳීමට විද්‍යාර්ථීන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

2. සෙසු විද්‍යාර්ථීයෙකු, කාර්ය මණ්ඩල සාමාජිකයෙකු, අමුත්තෙකු හෝ තෙවන පාර්ශවයක් වැනි කොළඹ විශ්වවිද්‍යාලයට අදාළ සාමාජිකයෙකුගේ/සාමාජිකයන්ගේ කීර්තිනාමයට හා ගෞරවයට හානි වන අයුරින් එහි විද්‍යාර්ථීන් ක්‍රියා නොකළ යුතුය.

3. විද්‍යාර්ථීන් ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ නීතිය හා සාමය පිළිපැදිය යුතුය. නීතිවිරෝධී ක්‍රියාවන් / අපරාධ හෝ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ නීතිය හා සාමය මගින් තහනම් කිරීමෙන් සීමා කර ඇති ඕනෑම ආකාරයක් කඩ කිරීමෙන් සිසුවෙකු කොළඹ විශ්ව විද්‍යාලයේ කීර්ති නාමයට හානි නොකළ යුතුය.

4. කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය තුළ හෝ ඉන් පිටත දී, නවක වදය දෙනු ලබන හෝ එයට සම්බන්ධ වනු ලබන හෝ "1998 අංක 20 දරණ අධ්‍යාපන ආයතනවල නවක වදය සහ වෙනත් ස්වරූපයේ සාහසික ක්‍රියා තහනම් කිරීමේ පනත" උල්ලංඝනය කිරීම සිදුකරන හෝ උල්ලංනය කරනු ලබන ඕනෑම විද්‍යාර්ථියෙක් / පුද්ගලයෙක් මෙම පනත යටතේ වරදකට වැරදිකරු වේ. සෑම විද්‍යාර්ථියෙකුටම විශ්ව විද්‍යාලවල නවක වදය උවදුර මැඩපැවැත්වීම සඳහා මාර්ගෝපදේශ කිහිපයක් හඳුන්වා දීම සඳහා 2010 දී නිකුත් කරන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 919 පිළිපැදිය යුතුය.

5. "1998 අංක 20 දරණ අධ්‍යාපන ආයතනවල නවක වදය සහ වෙනත් ස්වරූපයේ සාහසික ක්‍රියා තහනම් කිරීමේ පනත" යටතේ ලැයිස්තුගත කර ඇති බොහෝ අපක්‍රියා වසර දහයක් (10) දක්වා බරපතල සිර දඬුවම් ලැබිය හැකි මට්ටමේ වන අතර උක්ත පනත යටතේ ඇති අපක්‍රියා බොහොමයක් ඇප ලබා නොදිය හැකි මට්ටමේ ඒවා බව අවධාරණය කෙරේ. "1998 අංක 20 දරණ අධ්‍යාපන ආයතනවල නවක වදය සහ වෙනත් ස්වරූපයේ සාහසික ක්‍රියා තහනම් කිරීමේ පනත" තුළ අන්තර්ගත විධිවිධාන යටතේ විද්‍යාර්ථියෙකු වැරදිකරු වුවහොත් කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය වෙතින් ශිෂ්‍යභාවය අහෝසි කොට නෙරපා හැරිය හැකි අතර එම විද්‍යාර්ථියා විසින් සිදු කළ දේපලවලට සිදුවන හානියකට ද, වින්දිතයින්ට සිදු වූ තුවාල හෝ ජීවිත හානි වලට වන්දි ගෙවීමට ද බැඳී සිටී.

6. කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේහි ලියාපදිංචි වී සිටින කාල පරිච්ඡේදය තුළ, කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතන පරිශ්‍රය තුළ දී හෝ ඉන් පිටත දී, කිසිදු ආකාරයක නවක වදය හෝ වෙනත් ස්වරූපයේ සාහසික ක්‍රියාවක් ආරම්භ නොකරන බවටත්, එවැනි ක්‍රියාවන්ට ආධාර නොකරන බවටත්, ක්‍රියාවෙහි නොයොදවන බවටත් ප්‍රකාශ කරමින් ශිෂ්‍යයන් විසින් ප්‍රකාශයකට අත්සන තැබිය යුතුය.

7. කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේහි උපාධි අපේක්ෂකයෙකු / උපාධිධාරියෙකු ලෙස කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයෙහි කීර්තිය සහ ගෞරවය පවත්වා ගෙන යන සහ ප්‍රවර්ධනය කරන ආදර්ශමත් පුරවැසියෙකු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

8. තර්ජනාත්මක ආකාරයකින් කථා කිරීම හෝ ක්‍රියා කිරීම, ශාරීරික හානියක් / තුවාල සිදු කිරීම තහනම් ය; මෙයට පහත කරුණු ඇතුළත් වන අතර ඒවාට පමණක් සීමා නොවේ: භෞතික ආයතනයකට (උදා: ගොඩනැගිලි, රසායනාගාර / පුස්තකාල පහසුකම්) හානි සිදු කිරීම, කොළඹ විශ්වවිද්‍යාලයට සම්බන්ධ වුනු සෙසු ශිෂ්‍යයන්, කාර්ය මණ්ඩල සාමාජිකයන්, අමුත්තෙකු හෝ තෙවන පාර්ශවයක් වැනි පුද්ගලයෙකු/පුද්ගලයන්ට කායික හිංසා / ශාරීරික හිංසා තුවාල ආදිය සිදු කිරීම.

## ඊ. ආචාර ධර්ම පද්ධතිය වෙනස් කිරීම.

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේහි අධ්‍යක්ෂ සහ අදාළ බලධාරීන් විසින් මෙම ලේඛනයේ සඳහන් ආචාර ධර්ම පද්ධතිය වෙනස් කිරීමට, සංශෝධනය කිරීමට, වගන්ති තහවුරු කිරීමට යටත් වේ.

**ආචාර ධර්ම පද්ධතිය සඳහා වූ දිවුරුම් ප්‍රකාශය**

(නම:)...........................................................................................................................................

................................ වන මම,ලියාපදිංචි අංක ............................................... යටතේ උපාධි අපේක්ෂකයෙක් ලෙස පහත ප්‍රතිඥාව ලබා දෙමි.

1. කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයහි හා සම්බන්ධ මගේ අධ්‍යයන, පර්යේෂණ සහ වෙනත් ක්‍රියාකාරකම් වලදී මම අවංක වන්නෙමි.

2. අනාගතයේ කිසියම් වෙනස් කිරීමකට යටත්ව, මෙහි සඳහන් ආචාර ධර්ම පද්ධතියේ සහ කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයහි වෙබ් අඩවියේ ඇති මාර්ගෝපදේශ හා අගයන් මම පිළිපදින්නෙමි.

3. "1998 අංක 20 දරණ අධ්‍යාපන ආයතනවල නවක වදය සහ වෙනත් ස්වරූපයේ සාහසික ක්‍රියා තහනම් කිරීමේ පනත" සහ 2010.01.15 දින අංක 919 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ සඳහන් නවක වදය තහනම් කිරීමේ නීතිය මම හොඳින් කියවා සම්පූර්ණයෙන් තේරුම් ගෙන ඇත්තෙමි. මම මෙයින් පහත සඳහන් කරුණු තේරුම් ගත් බවත්, එයට අනුකූල වන බවත් ප්‍රතිඥා දෙමි.

(i) නවක වදය පිළිබඳ අර්ථ දැක්වීම යටතේ ඇති විය හැකි කිසිදු හැසිරීමක් හෝ ක්‍රියාවක් මම නොකරමි.

(ii) මම කිසිම ආකාරයකින් නවක වදය සඳහා සහභාගී නොවෙමි.

(iii) මම කාටවත් ශාරීරිකව හෝ මානසිකව හානියක් හෝ වෙනත් හානියක් නොකරමි.

(iv) කිසියම් ආකාරයක නවක වධයකට වැරදිකරු වුවහොත්, බලාත්මක කරන ලද නීතිය සහ කොළඹ විශ්ව විද්‍යාලයේ නීති අනුව මට දඬුවම් කළ හැකි බව මම මෙයින් එකඟ වෙමි.

4. මම මෙහි සඳහන් ආචාර ධර්ම පද්ධතිය, නීතියේ ආධිපත්‍යය, රීති සහ රෙගුලාසි වලට අනුකූලව කටයුතු කරන අතර කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයහි ගෞරවය පවත්වා ගන්නෙමි.

දිනය: .......................                                  ..........................................................

(විද්‍යාර්ථියාගේ අත්සන)